ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
නුගේගොඩ.

2020.04.20

**අභ්‍යන්තර චක්‍රලේඛ අංක - 2020/06**

**යොමුව :** **ප්‍රධාන වෛද්‍ය නිලධාරීනි,**
**සියළුම කාර්යභාර වෛද්‍ය නිලධාරීන්,**
**සියළුම වෛද්‍ය නිලධාරීන්,**
**අනෙකුත් සියළුම නිලධාරීන්,**
**සියළුම කාර්යභාර නිලධාරීන්,**
**සියළුම වැ/බ කාර්යභාර නිලධාරීන්,**
**සියළුම සේවක මහත්ම මහත්මීන් ,**

**ප්‍රධාන කාර්යාලය, අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කිලිනොච්චිය, කුරුණෑගල, මන්නාරම, මාතලේ, මාතර, මොනරාගල, මුලතිව්, නුවර එළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, වවුනියා, වේරහැර ශාඛා කාර්යාල**

**යොමු කරන්නා :** **සභාපති**

**විෂය :** **කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තිය වලක්වමින් සේවාවන් සැපයීම සඳහා සියලුම නිලධාරීන් /සේවකයින් විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ**

---

රට යථා තත්ත්වයට පත් වූ පසු **<u>කොවිඩ්-19</u>** වෛරසයෙන් ආරක්ෂා වී සේවාලාභීන්ට වඩාත් ගුණාත්මක සේවාවන් ලබාදීම සඳහා පහත පියවරයන් අනුගමනය කල යුතු බව මෙයින් දන්වනු කැමැත්තෙමි.

(1) ආයතනය විවෘත කිරීමට පෙර නිලධාරින්/සේවකයින් හා සේවාලාභීන් සඳහාද අවශ්‍ය ප්‍රමාණයට අත් සෝදන බේසම්(Sink) සහ සේදීමට අවශ්‍ය දේවල්ද සමග නිසි ස්ථානවල **කෙටි දැනුම් දීමකින්** සවිකල හැකි ක්‍රමයක් සකස් කර ගත යුතුව ඇත.

(2) **<u>"සියළු දෙනා මුහුණු ආවරණ පැලඳ සබන් යොදා තත්පර 20 ක් හොඳින් අත් සෝදා ඇතුළු වන්න"</u>** ලෙස ආයතනය වෙත ඇතුළු වන ස්ථානයේද, කොවිඩ්-<u>19</u> වෛරසයෙන් ආරක්ෂා වීමට පිළිපැදිය යුතු සෞඛ්‍යමය තොරතුරු ඇතුළත් දැන්වීම් පුවරු සේවා ස්ථානයේ ඇතුළත සේවාලාභීන්ට පැහැදිලි ව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කල යුතුව ඇත.

(3) කාර්යාලයට පැමිණෙන නිලධාරින්/ සේවකයින් මෙන්ම සියළුම සේවාලාභීන් සේවා ලබාගැනීමට පෙර ආයතනයේ පිටත ස්ථාපිත කර ඇති අත් සෝදන බේසම් (Sink) භාවිතා කොට **<u>සබන් යොදා හොඳින් අත් සෝදා</u>** , ප්‍රමිතියෙන් යුතු මුහුණු ආවරණ පැලඳ සිටීම අනිවාර්ය වන්නේය.

(4) වෛරසයෙන් ආරක්ෂාව වීමට කටයුතු කරන අතරතුර සේවාලාභීන්ගේ සේවාවන් ලබාදීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුව ඇත.

(5) සියළුම ශාඛා කාර්යාලවල සේවාලාභීන් හා සේවාදායකයින් නිතර පරිහරණය කරන ස්ථාන පිරිසිදුව පවත්වාගත යුතු අතර සෞඛ්‍ය ආරක්ෂණ පිළිවෙත් දැඩිව අනුගමනය කල යුතුව ඇත.

(6) හැකි සෑම අවස්ථාවකම අත් සේදීමේ ඇති වැදගත්කම පිලිබඳව අවධානය යොමුකල යුතුව ඇත.

(7) අප ආයතනයට අනුබද්ධව දිවයින පුරා සේවය කරන සියළුම නිලධාරින් හා සේවකයින් වෙත සෝදා නැවත භාවිතා කල හැකි ආකාරයේ මුහුණු ආවරණ දෙක බැගින්ද , අවශ්‍ය ප්‍රමාණයට විෂබීජනාශක ද්‍රාවණද ලබා දීමට කටයුතු කරනු ඇත.

(8) රසායනාගාරය, මුදල් අයකැමි,වෛද්‍ය ඕඩර්ලි හා වෛද්‍ය පෝරම නිකුත් කිරීම වැනි අවදානම් යයි හැඟෙන අංශවල සේවය කරන නිලධාරින්/ සේවකයින් සඳහා අත් ආවරණ ලබා දෙනු ඇත.

(9) පැමිණෙන සියළු සේවාලාභීන් සියළු අංශ යටතේ සේවා ලබාගැනීමට අසුන් ගැනීමේදී හා ආයතනය තුළ කටයුතු කිරීමේදි සෑම අවස්ථාවකදීම මීටරයක (1m) දුර පරතරය තබා ගැනීම අනිවාර්යය වේ. **මේ පිළිබඳව කටයුතු සකස් කොට , සේවාලාභීන් පැමිණීමට පෙර , කාර්යය මණ්ඩලයේ සියලු දෙනා එකතුව කිසියම් පෙරහුරුවක් කරන්නේ නම් වඩා උචිත වනු ඇත.**

(10) එක්වරකදී සීමාසහිත සේවාලාභීන් ප්‍රමාණයක් පමණක් එක් එක් සේවා අංශ වෙත යොමු කල යුතුව ඇත.

(11) සෑම වෛද්‍යවරයෙක් විසින්ම වෛද්‍ය පරීක්ෂණය ආරම්භයේදී සේවාලාභීන් වෙත වෛරසයෙන් ආරක්ෂා වන ආකාරය හා රෝගය පිළිබඳ කෙටි හැඳින්වීමක් කල යුතුව ඇත.එය ඔබගේ යුතුකමක් බව සලකන්න.

(12) එක්වරකදී සේවාලාභීන් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් හෝ ඊට අඩු ප්‍රමාණයක් පමණක් අදාල වෛද්‍ය නිලධාරි කාමර වෙත යොමුකල යුතුව ඇත.

(13) අක්ෂි පරීක්ෂාවේදී , සේවාලාභීන් සඳහා භාවිතා කරනු ලබන ඇස් ආවරණ සෑම එක් පාවිච්චියකින් පසු වෛද්‍ය නිලධාරි කාමරයේ ඇති විෂබීජ නාශක ද්‍රාවණය මගින් විෂබීජහරණය කිරීම සුදුසු වන්නේය.

(14) වෛද්‍ය නිලධාරි කාමරය තුළ සිදුකරන සියලු පරීක්ෂණ වලදී හැකි සෑම විටකම මීටරයක (1m) පරතරය තබා ගැනීමට කටයුතු කල යුතුව ඇත .

(15) දොර ලොක් හා දොර අගුල් වැනි නිතර ස්පර්ශ වන ස්ථාන හැකි සෑමවිටම අඩුවෙන් පරිහරණය වන පරිදි සැලසුම් කල යුතු වන අතර නිරන්තරයෙන් විෂබීජහරණය කල යුතුව ඇත.

(16) ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමට පෙර ඇඟිලි සලකුණු යන්ත්‍රය පිරිසිදු කොට තිබිය යුතු අතර නිලධාරින් හා සේවකයින් කාර්යාලයට පැමිණීමට පෙර හා කාර්යාලයෙන් පිටවීමට පෙර සබන් යොදා අත් සේදීම කල යුතු නිසා ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් වෛරස ව්‍යාප්තියක් සිදු වීමට කිසිදු අවධානමක් නොමැත.

(17) සේවාලාභීන්ගේ පැමිණීම සමහර විට පාලනය කල නොහැකි හා අපේක්ශිත ප්‍රමාණයකට වඩා වැඩිවීමට පුලුවන. එබැවින් පැමිණෙන වේලාවන් කලින් වෙන් කර ගැනීමට හැකි වන පරිදි සේවාලාභීන් වෙත එක් ශාඛාවකින් දුරකථන අංක කිහිපයක් වෙන් කරන්නේ නම් මැනවි . එසේ කල හැකි නම් ඒ බව මාධ්‍ය හරහා දැනුම් දීමට පුලුවන . ඒ පිළිබඳව සෑම ආයතනයක් භාර නිලධාරින් තම අවධානය යොමු කරවන්නේ නම් මැනවි.

(18) **මේ දිනවල දිස්ත්‍රික්කයකින් දිස්ත්‍රික්කයකට යෑම හා ඒම මහජනතාවට සීමා කොට ඇති නිසා විශේෂ අවස්ථාවකදී හැර, තම දිස්ත්‍රික්කයට අයත්වන සේවාලාභීන්ට පමණක් සේවා ලබා දීම සුදුසු වන්නේය.**

(19) සතියේ දිනයන්හිදී සේවාලාභීන් සංඛ්‍යාව අනුව රාජකාරි වේලාව ඉක්මවා වුවද සේවා සැපයිමට හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කොට තිබිය යුතු වන්නේය.

(20) සේවා අවශ්‍යතාව අනුව සේවාවන් සති අන්තයේ එනම් සෙනසුරාදා හා ඉරිදා දිනද ලබා දීමට සිදු වුවහොත් එසේ සේවාවන් සැපයිමට හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කොට තිබිය යුතු වන්නේය.

<u>රාජකාරි කාලය තුළදී භාවිතා කල යුතු ආරක්ෂක පියවර :</u>

1. සේවා ස්ථානයේ සිදු කෙරෙන සියළුම රාජකාරි කටයුතු වලදී කායික දුරස්ථභාවය මීටරයක පරතරයකින් පවත්වා ගත යුතුව ඇත.
2. සේවා ස්ථානය තුළදී අනවශ්‍ය පරිදි එක්රැස් වීම් හා අනවශ්‍ය කතාබහ කිරීම් වලින් වැලකිය යුතුව ඇත.
3. ජංගම දුරකථන,පෑන්,පැන්සල් හා පොත් යන ද්‍රව්‍ය සියළු දෙනා අතර හුවමාරු කිරීමෙන් වැලකිය යුතුය.
4. ආහාර ගැනීමේදී හා අනෙකුත් කටයුතු වලදී සමූහ වශයෙන් රැස්නොවී දුරස්ථ භාවය පවත්වා ගෙන කටයුතු කල යුතුව ඇත.

5. ආයතනය තුල ඇති දොරවල් විවෘතව තැබීම මගින් ස්පර්ශ වන මතුපිටවල් ප්‍රමාණය සීමා කරගත යුතුව ඇත.
6. කොවිඩ්-19 ආසාදිත රෝගී ලක්ෂණ(කැස්ස,උණ,සෙම්ප්‍රතිශ්‍යාව හෝ ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග ලක්ෂණ) යැයි සැක සහිත පුද්ගලයෙකු හෝ සේවකයෙකු, ආයතනය තුළ නිරීක්ෂණය වුවහොත් වහාම 1390 දුරකථන අංකය අමතා සෞඛ්‍ය උපදෙස් අනුගමනය කර ඔහු/ඇය ලඟම පිහිටි රෝහල වෙත යොමු කිරීමට කටයුතු කල යුතුව ඇත.
7. රෝග ලක්ෂණ යැයි සැක සහිත පුද්ගලයෙකු නිරීක්ෂණය වුවහොත් එම පුද්ගලයාගේ ගරුත්වය හා අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි කටයුතු කල යුතුව ඇත.
8. කැස්ස,උණ,සෙම්ප්‍රතිශ්‍යාව හෝ ශ්වසන පද්ධතිය ආශ්‍රිත කිසියම් රෝග ලක්ෂණයක් තමාට මතු වුවහොත් හෝ කොවිඩ්-19 රෝගීන් තමා පදිංචි ප්‍රදේශයෙන් වාර්තා වුවහොත් ඒ බව තම සේවා ස්ථානය වෙත වාර්තා කර රාජකාරිට නොපැමිණ රජය මගින් දක්වා ඇති සෞඛ්‍ය උපදෙස් අනුගමනය යුතු බවට සියලු කාර්ය මණ්ඩලයට දැන්විය යුතුව ඇත.

**<u>රාජකාරියට පැමිණීමේදී හා රාජකාරිය නිම වූ පසු භාවිතා කල යුතු ආරක්ෂක පියවර:</u>**

1. ආයතනය වෙත පැමිණීමේදී හා රාජකාරි නිමවී නිවසට යාම දක්වා ප්‍රවාහන සේවයේදීද මුහුණු ආවරණ භාවිතා කල යුතු අතර මීටරයක (1m) දුර පරතරය තබා ගැනීමට කටයුතු කල යුතුව ඇත.
2. රාජකාරි වාහනය භාවිතයේදී සෑම අවස්ථාවකදීම දොරවල් ඇරීම හා වැසීම රියදුරු විසින් පමණක් සිදුකිරීම වඩා උචිත වනු ඇත.
3. හැකි තරම් දුරට අත් ඔර්ලෝසු , මුදු, මාල වළලු ආදිය භාවිතය අඩු කරන්නේ නම් මැනවි.
4. රාජකාරි නිමවී නිවසට ඇතුළු වීමට පෙර සියළු ඇඳුම් හා මුහුණු ආවරණ සෝදා තමන් ද හොඳින් පිරිසිදු වී , පාවහන් හා ජංගම දුරකථන ආදී තමන් විසින් එදිනෙදා පරිහරණය කල සියළු භාණ්ඩ විෂබීජහරණය කිරීමෙන් පසු නිවසට ඇතුළු වී නිවසේ සාමාන්‍ය දෛනික කටයුතු වල යෙදීම සුදුසු වනවා ඇත.

**<u>මුහුණු ආවරණ භාවිතා කිරීමේදී භාවිතා කල යුතු ආරක්ෂක පියවර:</u>**

1. මුහුණු ආවරණ පැලඳීමට පෙර හා පසු අත් සබන් යොදා හොඳින් සේදිය යුතුව ඇත.
2. මුහුණු ආවරණ භාවිතා කරන අවස්ථා වලදී මුහුණු ආවරණයේ මතුපිට පෘෂ්ඨය ස්පර්ශ කිරීම් හෝ ඇස, කන හෝ නාසය ආදිය ස්පර්ශ කිරීම් සිදු නොකල යුතුව ඇත.
3. අප ආයතනය විසින් එක් එක් නිලධාරීන් / සේවකයින් සඳහා නැවත සෝදා පිරිසිදු කල හැකි ඉහල ප්‍රමිතියකින් යුතු මුහුණු ආවරණ දෙක බැගින් ලබා දීමට කටයුතු කරනු ඇත.

**ඉතා වැදගත් : ඉදිරි තත්වයන් මත කෙටි දැනුම් දීමකින් පසු දිස්ත්‍රික් මට්ටමින් සේවාවන් ආරම්භ කිරීමට සිදු විය හැකිය. එවිට එම සේවාවන් අප සහෝදර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමග එක්වී සිදු කල යුතු අතර ඒ බව අවශ්‍යතාවය අනුව හැකි ඉක්මනින් ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.**

**වෛද්‍ය සචින්ද්‍ර ගමගේ**
සභාපති
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය.

*පිටපත්* :1) **ගරු අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා**
**අමාත්‍ය, ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා**
2) **ගාමිණි සෙනෙවිරත්න මහතා**
**ලේකම්, ප්‍රවාහන සේවා කලමනාකරණ අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා**
3) **මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් - කාරුණික දැනගැනීම සඳහා**
**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**
4) **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහතුන් වෙත - කාරුණික දැනගැනීම සඳහා**
5) **ගොනුවට**